# කෝලම් නාටකයේ වෙස් මුහුණුවල කලාත්මක අගය  පිළිබඳ අධ්‍යයනයක්

**විජය ශ්‍රී විතාරණ**
**භාෂා හා සංස්කෘතික අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය**
***Wijayassri@gmail.com***

මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ කෝලම් නාටකයේ වෙස් මුහුණුවල කලාත්මක අගය  පිළිබඳ ව විමර්ශනය කිරීම යි. කෝලම් නාටකය ගැමියන්ගේ විනෝදාස්වාදය සඳහා නිර්මාණය වූවකි. කෝලම් නාටකයට අයත් චරිත අතුරින් සබේ විදානේ  සහ සභාපතිවරු හැර සෙසු චරිත සියල්ල ම තම භූමිකා සඳහා වෙස් මුහුණු භාවිත කරති.

අතීතයේ සිට ම කෝලම් නාටකය සඳහා වෙස් මුහුණු භාවිත කරන්නට ඇති බැව් කෝලම් පිටපත් අධ්‍යයනයෙන් පැහැදිලි ය. මෙම වෙස් මුහුණු සකස් කිරීමට  භාවිත ලී වර්ග මෙන් ම අනුගමනය කරන ක්‍රම වේදයන් ද කලාත්මක අගයෙන් බැඳී පවතී. සාම්ප්‍රදායික කෝලම් ශිල්පීන්ට අනුව අතීතයේ මෙම වෙස් මුහුණු කැපීම සඳහා භාවිත කර ඇත්තේ නිම් පොල් හෙවත් දින් නැමැති ගස්වල අතු ය. එම වෙස් මුහුණු කල් තබා ගැනීමේ අපහසුතා නිසා එරබදු වෙල් කදුරු රුක් අත්තන යන ගස්වල ලී යොදා ගෙන ඇත. කෝලම් නාටකයට අයත් වෙස් මුහුණු අතුරින් බොහොමයක් කැපීම කරනු ලබන්නේ ඇඹුම් කවිවලට අනුව වන අතර වෙස්මුහුණු කැපීම ඉතා සියුම් වූ නිර්මාණශීලී කලාවකි.  වෙස්මුහුණුවල වර්ණ ගැන්වීම කරනු ලබන්නේ ඒ ඒ චරිතයන්හි ස්වභාවය හා දේහ ලක්ෂණවලට අනුව ය. වෙස්මුහුණුවල සංකේත හා වර්ණ භාවිතය මෙන් ම  කැටයම් සඳහා යොදා ගෙන ඇති  සිංහල සැරසිලි මෝස්තර ආදිය තුළින්  විවිධ රස භාව උද්දීපනය කර තිබීම  වෙස් මුහුණු ශිල්පියාගේ විශේෂ කුසලතාවක් ලෙස සැලකිය හැකි ය.

ශ්‍රී ලංකාවේ කෝලම් නාටකය  ප්‍රචලිත ප්‍රදේශ අතුරින් මෙම අධ්‍යයනය සඳහා කළුතර දිස්ත්‍රික්කයට අයත් ඔලබොඩුව, මාතර දිස්ත්‍රික්කයේ වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මිරිස්ස, ගාල්ල දිස්ත්‍රික්කයේ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හිරේවත්ත සහ මහ අම්බලන්ගොඩ යන ප්‍රදේශයන්හි පාරම්පරික කෝලම් ශිල්පීන් සතුව ඇති වෙස්මුහුණු තෝරා ගනු ලැබී ණ. මෙම පර්යේෂණය සඳහා මූලාශ්‍රය ලබා ගැනීමේ දී ප්‍රායෝගික නිරීක්ෂණ සහ සම්මුඛ සාකච්ඡා වැදගත් වූ අතර ලිඛිත මූලාශ්‍රය ද අධ්‍යයනය කරන ලදී.

මෙම අධ්‍යයනය මගින්  පැහැදිලි වූ කරුණක්  නම් කෝලම් වෙස්මුහුණු සිංහල ගැමි කලාකරුවන් අතින් නිර්මාණය වූ  කලාත්මක අගයෙන් පිරුණු උසස් කලා  සම්ප්‍රදායක් බව යි.  එසේ ම පෙරදිග රටවල වෙස්මුහුණු අතර කෝලම් වෙස්මුහුණු ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාව කියාපාන විස්මිත කලා නිර්මාණයක් බව යි.

***ප්‍රමුඛ පද*** **:** *කලාත්මක, කෝලම්, ඇඹුම් කවි , කැටයම්, සැරසිලි මෝස්තර*